ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 20087/2009

නීති විද්‍යාව - **LWU 4311/4321**

කාලය - විනාඩි 40

---

දිනය - 2008.10.16 වේලාව - පෙ.ව. 10.00 - පෙ.ව. 10.40 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. හමුදා කුමන්ත්‍රණයකට පසුව රුසිටානියාවේ බලයට පත්වන මුස්තාපා දැඩි ඒකාධිපතියකු ලෙස රාජ්‍යය පාලනය කරයි. මුස්තාපාගේ කෲර ඒකාධිපතිත්වයට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ඒමට රුසිටානියානු පාර්ලිමේන්තුව තීරණය කර තිබේ. අනෙකුත් කරුණු අතර මුස්තාපා විසින් කිසිදු වලංගු හේතුවකින් තොරව අග්‍ර විනිශ්චයකාරවරයා ධූරයෙන් පහකර ඇති බවටද පොදු දේපල අයුතු ලෙස පරිහරණය කළ බවටද, සිය තත්ත්වය ශක්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය වන ආකාරයේ පනත් සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත නිරන්තර බලපෑම් එල්ල කරන බවටද චෝදනා ඉදිරිපත් වී ඇත. ජනතා නියෝජිතයන් වන තමුන්ට මුස්තාපාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ඒමට අයිතියක් ඇති බව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කියා සිටිති.

    රුසිටානියාවේ ඉහත පවතින තත්ත්වයෙහි නීති විද්‍යාත්මක ඇගවීම් ස්වභාවික නීති විද්‍යා සිද්ධාන්තය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. ඔස්ටින්ගේ ස්වාධිපත්‍යය පිළිබඳ සංකල්පයෙහි වලංගුභාවය සමකාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල භාවිතයන් ඇසුරෙන් විවේචනාත්මකව අගයන්න.

- හිමිකම් ඇවිරිණි. -